ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

## ඉන්දීය නාවික හමුදාවේ කුතාර් නෞකාව කොළඹට පැමිණේ

දේශීයව නිපදවන ලද කුර්කි පන්තියේ නෞකාවක් වන ඉන්දීය නාවික හමුදාවේ කුතාර් නෞකාව තෙදින සංචාරයක් සඳහා 2025 මාර්තු 03 වන දින කොළඹ වරායට පැමිණියේය. ශ්‍රී ලංකා නාවික හමුදාවේ තූර්ය වාදන සමඟින් ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් විසින් නෞකාව සාම්ප්‍රදායානුකූලව පිළිගන්නා ලදී. නෞකාවේ අණ දෙන නිලධාරී කොමාන්ඩර් නිතින් ශර්මා මහතා බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරාල් එම්. එච්. සී. ජේ. සිල්වා මහතා හමු විය.

2. නෞකාවේ පැවති උත්සවයකදී, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ සුරක්ෂා නෞකාවේ සවිකර ඇති ප්‍රධාන ආරක්ෂක පද්ධතියේ අත්‍යාවශ්‍ය අංගයක් වන ගිනි නිවීම් පද්ධතිය සඳහා නැවත පුරවන ලද සිලින්ඩරයක් නිල වශයෙන් භාර දෙන ලදී. ඉන්දීය රජය විසින් ගැඹුරු මුහුදු නිරීක්ෂණ නෞකාවක් වන සුරක්ෂා නෞකාව 2017 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී. ඉන්දියාව විසින් 2021 ජූනි, 2022 අප්‍රේල් සහ 2024 ජූනි මාස වලදී නෞකාව සඳහා අමතර කොටස් තිළිණ කරන ලදී. එසේම, 2024 ජනවාරි මාසයේදී සිලින්ඩර නැවත පිරවීම සඳහා සහය ලබා දෙන ලදී.

3. කොළඹ සිටින කාලය තුළ INS කුතාර් නෞකාව දෙරට නාවික හමුදාවන් අතර මනා පිළිවෙත් බෙදා හදා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් සඳහා නෞකාවේදී වෘත්තිමය අන්තර් ක්‍රියා පවත්වනු ඇත. නෞකා වෙත ආරක්ෂිතව ගොඩවීම, සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම (VBBS) සහ බලකා ආරක්ෂණ මෙහෙයුම් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම් ද ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නෞකා කාර්ය මණ්ඩලය වෙත සිදු කරනු ඇත. නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ විවිධ ක්‍රීඩා සහ යෝගා වැඩසටහන් ද පවත්වනු ඇත.

4. මෙම සංචාරය කලාපයේ සාගර ආරක්ෂාව සම්බන්ධයෙන් පොදු අභියෝගයන්ට කාර්යක්ෂමව මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ හැකියාවන් ඉහළ නැංවීම උදෙසා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවයට පවතින

අවස්ථාව සම්බන්ධයෙන් ද වැදගත් නිදසුනකි. නෞකාව 2025 මාර්තු 6 වන දින ශ්‍රී ලංකාවෙන් පිටත් වීමට නියමිතය.

5. වඩාත් මෑත කාලීනව, 2024 දෙසැම්බර් 23 වන දින සිට 2025 ජනවාරි 02 වන දින දක්වා ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ වෛභව් සහ අභිරාජ් යන නෞකා කොළඹ සහ ගාල්ලේ සංචාරයක නිරත විය. ඉන්දියානු නාවික හමුදා සහ වෙරළාරක්ෂක බලකා නෞකාවන්ගේ ශ්‍රී ලංකා සංචාරයන්ගේ අරමුණ වන්නේ ඉන්දියාවේ ‘අසල්වැසියා ප්‍රථමයෙන්’ යන ප්‍රතිපත්තිය සහ අග්‍රාමාත්‍යතුමාගේ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR) යන දැක්ම අනුව දෙරටේ මිත්‍රශීලී නාවික හමුදාවන් සහ වෙරළාරක්ෂක බලකායන් අතර සහෝදරත්වය සහ කාර්ය සහයෝගීතාවය ශක්තිමත් කිරීමයි.

***

**කොළඹ**

***2025*** *මාර්තු* ***03***